*[සියලුම හිමිකම් ඇවිරිණි]*

179 A

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ, ශ්‍රී ලංකා වාස්තුවිද්‍යාත්මක සේවයේ සහ රජයේ අනෙකුත් සේවාවල නිලධාරීන් සඳහා වූ පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණය 2010 (ඔක්තෝබර්/නොවැම්බර්)

## (09) සිංහල ( දෙවන භාෂාව)
## Sinhala (Second Language)

පැය දෙකයි

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1. ඔබගේ රාජකාරිය වඩා සක්‍රියව කිරීම සඳහා කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් හැදෑරීම සුදුසුය යි ඔබට සිතේ. ඔබ තෝරාගත් පාඨමාලාව හැදෑරීම සඳහා අවශ්‍ය නිවාඩු හා මූල්‍ය ප්‍රතිපාදන ඉල්ලා ඔබගේ ආයතන ප්‍රධානියා වෙත ලිපියක් (වචන 150 කින් පමණ) සිංහල බසින් ලියන්න. පාඨමාලාවේ නම, පාඨමාලාවේ ස්වභාවය සහ අරමුණු, පාඨමාලාව සඳහා ගතවන කාලය, ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන, ඉන් ඔබට සහ ආයතනයට ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව එහි අඩංගු කරන්න.

(ලකුණු 20)

2. අ. පහත දැක්වෙන සිංහල යෙදුම්වලට ගැලපෙන දෙමළ/ඉංග්‍රීසි යෙදුම් ලියන්න.

   i. තේරීම් මණ්ඩලය
   ii. අනුකමිටුව
   iii. ටෙන්ඩර් පටිපාටිය
   iv. නොවැළැක්විය හැකි හේතුවක් නිසා
   v. අන්තර් ජාතික සමුළුව
   vi. පෞද්ගලික කරුණු මත

(ලකුණු 1 1/2 x 6 = 09)

   ආ. පහත සඳහන් ඉංග්‍රීසි යෙදුම් සිංහලට පරිවර්තනය කරන්න.

   i. confirmation of the minutes
   ii. matters arising from the minutes
   iii. appeal board
   iv. social service organization
   v. traditional societies
   vi. domestic violence

(ලකුණු 1 1/2 x 6 = 09)

3. පහත දැක්වෙන ඉංග්‍රීසි වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.

   i. The other point is about the co-operative sector.

   ii. I remember they protested about this at the beginning of this year and they brought this to my notice.

   iii. They did not like the development that was taking place.

   iv. How did this become dangerous?

v. Unfortunately that particular day was the day where my son was getting married.

vi. Now I come to a very important aspect of the budget proposals.

vii. You should read carefully the instructions given at the back side of this paper.

viii. Please bring all relevant certificates with you.

ix. You are cordially invited to the committee meeting to be held on 25th October 2010 at 9.30 am.

x. If the said amount is not paid within 30 days, the bank shall have the right to re-sell the property.

(ලකුණු 2 x 10 = 20)

4. පහත සඳහන් එකිනෙක වාක්‍යය අර්ථවත් වන ආකාරයට සුදුසු වචනවලින් හිස්තැන් පුරවන්න. ප්‍රශ්න අංකය හා ඔබ යෝජනා කරන වචනය පමණක් පිළිතුරු පත්‍රයේ සඳහන් කරන්න.

i. සෞඛ්‍ය කටයුතු සෑම රටකම --- සෑම දෙනාගේම අවධානයට ලක් වේ. එනිසා එය ලෝකයේ ප්‍රධාන කර්මාන්තවලින් එකක් -- ද සැලකිය හැකිය.

ii. අප දන්නා --- මේ සඳහා විවිධ හේතු බලපෑ හැකිය.

iii. අපගේ පහසුව -- වැදගත් යැයි සැලකෙන කරුණු පමණක් ගෙන බලමු.

iv. තමාගේ යහපත් පැත්ත පමණක් දකින -- එය සකස් වී ඇත.

v. මා පැමිණෙන -- ඔබ කාර්යාලයේ රැඳී සිටින්න.

vi. ගැසට් පත්‍රයෙහි පළකිරීම --- දැන්වීම් භාරගනු ලැබේ.

vii. 2010 ඔක්තෝබර් 10 වන දින පැමිණෙන --- ඉල්ලා සිටිමි.

viii. ඒ --- විමසීමට --- නොවිමසීම යහපත් විය හැකිය.

(ලකුණු 1 x 10 = 10)

5. පහත සඳහන් වාක්‍යවල හිස්තැන් සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න. ප්‍රශ්න අංකය හා ඔබ යෝජනා කරන වචනය පමණක් පිළිතුරු පත්‍රයේ සඳහන් කරන්න.

i. ඔහු විසින් --------- ප්‍රකාශය මත පොලීසිය සැකකරු අත්අඩංගුවට ගත්තේය.

ii. සමහරු බොරු ---

iii. මා විසින් මෙසේ අසන ----

iv. සිල් මෑණියෝ අපවත් ---

v. උන් වහන්සේ තම ජීවිතයම සමාජ සේවය සඳහා කැප ---

(179)

vi. ඔවුහු ----- ලෙස හඳුන්වනු ලැබෙති.

vii. ඇතමෙක් සාපරාධී ක්‍රියාවල නිරත ---

viii. ---- මගෙන් ඒ ගැන විමසුවහොත් මම මෙසේ කියමි.

(ලකුණු 2 x 8 = 16)

6. පහත සඳහන් පද ගලපා එක් පදයක් සේ ලියන්න.

| | | | |
|---|---|---|---|
| i. | මාර්ග උපකරණ | ii. | විවේචන ආත්මක |
| iii. | සමාජ අනුයෝජනය | iv. | ග්‍රන්ථ ආගත |
| v. | රෝග ආබාධ | vi. | මූල ආශ්‍රය ආශ්‍රිත |
| vii. | සත්‍ය අසත්‍යතාව | viii. | පරම ආදර්ශ |

(ලකුණු 1 x 8 = 8)

7. පහත සඳහන් වචනවලට ගැලපෙන විරුද්ධාර්ථවත් වචන ලියන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| i | ව්‍යාජ | ii. | ගැඹුරු | iii. | ආනයන |
| iv. | සම්මත | v. | අවබෝධය | vi. | දෝෂ |
| vii. | මංගල්‍යය | viii. | වරද | | |

(ලකුණු 1 x 8 = 8)

*****************